# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 243/46—1976 දෙසැම්බර් 17 වැනි සිකුරාදා—1976.12.17

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ජේදය—සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

ජනා. කා. අංකය : ඩබ්ලිව්. 68(70)/76.

**(40 වන අධිකාරය වූ) මහාජන ආරක්ෂක ආඥාපනත**

අගමැතිගේ නිර්දේශය අනුව මහාජන ආරක්ෂක ආඥාපනතේ 5 වන වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සාදනු ලැබූ නියෝග.

**වි. ගොපල්ලව,**
ජනාධිපතිවරයා.

1976 දෙසැම්බර් මස 17 වැනි දින,
කොළඹ,
ජනාධිපති කාර්යාලයේ දී ය.

**නියෝග**

1. මේ නියෝග හදිසි අවස්ථා (රාජ්‍ය නිලධරයන් ආරක්ෂා කිරීමේ) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 44 දරන යුක්තිය පසිඳලීමේ පනතේ කුමක් සඳහන්ව ඇත ද මේ නියෝග බලපැවැත්විය යුතුය.

3. දණ්ඩ නීති සංග්‍රහයේ 323 වන වගන්තිය (රාජ්‍ය නිලධරයකුට තුවාල සිදු කිරීම) හෝ 324 වන වගන්තිය (රාජ්‍ය නිලධරයකුට බරපතළ තුවාල සිදු කිරීම) හෝ 344 වන වගන්තිය (රාජ්‍ය නිලධරයකුට සාපරාධී බලහත්කාරකම් පෑම) යටතේ වරදක් කර ඇතැයි යම් තැනැත්තකු සැක කරනු ලබන හෝ ඔහුට විරුද්ධව චෝදනා නගා ඇති අවස්ථාවක ඔහු මහේස්ත්‍රාත්වරයකු ඉදිරියට පැමිණ විය යුතු අතර, පැමිණිල්ල පදනම් රහිත හෝ පීඩාකාරී හෝ නොවැදගත් ස්වභාවයේ එකක් බවට වාර්තා ගත කළ යුතු වූ හේතු මත තමා සලකන්නේ නම් මිස මහේස්ත්‍රාත්වරයා විසින් එම තැනැත්තා සිරභාරයේ තැබිය යුතුය.

4. (1) 3 වන නියෝගය යටතේ යම් තැනැත්තකු සිරභාරයේ තබනු ලැබූ අවස්ථාවක මහේස්ත්‍රාත්වරයා විසින් එම සිරභාරයෙහි තැබීම සහ එම කාරණයට අදාළ කරුණු වහාම අධිකරණ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත දැන්විය යුතුය.

(2) යම් තැනැත්තකු එසේ සිරභාරයේ තබනු ලැබූ අවස්ථාවක අධිකරණ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් තම අභිමතය පරිදි බන්ධනාගාර කොමසාරිස්වරයා අමතා ලියවිල්ලකින් කරනු ලබන නියමයක් මගින් ලේකම්වරයා විසින් එම නියමයෙහි සඳහන් කරනු ලැබිය හැකි යම් නියම හා කොන්දේසි වෙත් නම් ඒවාට යටත්ව එම තැනැත්තා මුදාහැරිය යුතු යයි විධානය කරනු ලබන්නේ නම් මිස, ඒ තැනැත්තාට විරුද්ධ නඩු කටයුතු නිම වන තුරු ඔහු බන්ධනාගාර කොමසාරිස්වරයාගේ භාරයෙහි සිටිය යුතුය.

(3) අධිකරණ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් මේ නියෝගය යටතේ කරනු ලැබූ නියමයක් ලැබුණු විට, ඒ නියමය ක්‍රියාවේ යෙදවීම බන්ධනාගාර කොමසාරිස්වරයාගේ කාර්යය වන්නේය.

(4) මේ නියෝගය යටතේ යම් තැනැත්තකු යම් නියම හෝ කොන්දේසිවලට යටත්ව මුදාහරිනු ලැබූ අවස්ථාවක ඒ නියම හෝ කොන්දේසිවලට අනුකූලවීම හෝ ඒවා ඉටු කිරීම එම තැනැත්තාගේ කාර්යය වන අතර එසේ කිරීම පැහැර හැරීම වරදක් වන්නේය.


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

107A——ඒ 24290—2,100 (76/12)